# I වන පරාක්‍රමබාහු රජුගේ දේශපාලන ප්‍රතිපත්තිය

එච්. ඩී. එම් ගයන්තිකා
විශේෂවේදී තෙවන වසර
ඉතිහාසය අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
melani.gayanthika10@gmail.com

**සංක්ෂේපය**

ලංකා ඉතිහාසය විමසා බලන විට එය යුග වශයෙන් සාකච්ඡාවට ලක් කිරීමට හැකියාව පවතී. එහිදී අප මූලිකවම අවධානය යොමු කරනු ලබන්නේ රජරට ශිෂ්ටාචාර සමයටයි. එම සමස්ත ශිෂ්ටාචාරය තුළ වැදගත් යුගයක් වශයෙන් පොළොන්නරු රාජධානි සමය පෙන්වා දිය හැකි ය. මේ යුගය තුළ රාජත්වයට පත් වූ වැදගත් පාලකයින් කිහිප දෙනෙක් අපට හඳුනාගත හැකිය. එම ශ්‍රේෂ්ඨ පාලකයින් අතරින් වැදගත් පාලකයෙකු ලෙස I වන පරාක්‍රමබාහු හෙවත් මහා පරාක්‍රමබාහුට හිමි වන්නේ අද්විතීය ස්ථානයකි.

I වන පරාක්‍රමබාහු රජුගේ දේශාපාලන මුහුණුවර, ඔහු විසින් ක්‍රියාත්මක කළ විදේශ ප්‍රතිපත්තිය කෙබඳු වේද, රාජ්‍ය පාලනයට සම්බන්ධ වූ නිලධාරීන් කවුරුන් ද, රජුගේ විදේශ ප්‍රතිපත්තිය තුළ රාජ්‍ය නිලධාරින් බලයට පත් වූයේ කෙසේ ද යන සියල්ලම පිළිබඳව අවධානය යොමු කිරීම මාගේ මූලික අරමුණ වශයෙන් පෙන්වාදිය හැකිය. මොහුගේ දේශපාලන ක්‍රියාපටිපාටිය පොළොන්නරු රාජධානියේ ස්ථාවරත්වයට මෙන් ම පරිහානියට ද බලපා ඇත. මෙම අධ්‍යයනයේ දී සාහිත්‍ය හා පුරාවිද්‍යා මූලාශ්‍රය යොදා ගත් අතර එම මූලාශ්‍රය යොදා ගනිමින් මහා පරාක්‍රමබාහු යටතේ දේශපාලන ක්‍රියාන්විතය කුමන ආකාරයේ මුහුණුවරක් ගත්තේ ද යන්න විමර්ශනය කර ඇත. මේ අනුව බලන විට පොළොන්නරු රාජධානිය මුල්කරගෙන අභියෝගයන්ට මුහුණ දෙමින් තම රාජ්‍ය බලය පොළොන්නරු රාජ්‍ය තුළ ස්ථාවර කර ගැනීමට I වන පරාක්‍රමබාහු රජුට හැකියාව ලැබුණු බව මෙයින් නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද : දේශපාලන, ප්‍රතිපත්ති, පාලනය**